සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2021 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2021-03-20
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** මූලික අයිතිවාසිකම් (Fundamental Rights) සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තේ කවර අධිකරණයට ද?

(1) මහේස්ත්‍රාත් අධිකරණය. (2) දිස්ත්‍රික් අධිකරණය.
(3) අභියාචනාධිකරණය. (4) ශ්‍රේෂ්ඨාධිකරණය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ පොදු නීතිය වන්නේ කුමක් ද?

(1) උඩරට නීතිය. (2) රෝම ලන්දේසි නීතිය. (3) ඉංග්‍රීසි නීතිය. (4) මුස්ලිම් නීතිය.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, CIF ගිවිසුමකදී (CIF Agreement) විකුණුම්කරු විසින් ගැනුම්කරුට බාරදිය යුතු ලේඛනයක් වන්නේ කුමක් ද?

(1) නෞභාර පත්‍රය. (2) ඉන්වොයිසිය.
(3) රක්ෂණ සහතිකය. (4) ඉහත සඳහන් සියල්ලම.

1.4 ගිවිසුම් නීතියට අනුව "ප්‍රතිග්‍රහණය" (Acceptance) සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න:

(1) ප්‍රතිග්‍රහණය යනු අර්පනලාභියා විසින් අර්පනකරු වෙත කරනු ලබන කොන්දේසි සහිත පිළිගැනීම වේ.

(2) ප්‍රතිග්‍රහණය යනු අර්පනකරු විසින් අර්පනලාභියා වෙත කරනු ලබන කොන්දේසි සහිත පිළිගැනීම වේ.

(3) ප්‍රතිග්‍රහණය යනු අර්පනලාභියා විසින් අර්පනකරු වෙත කරනු ලබන කොන්දේසි විරහිත පිළිගැනීම වේ.

(4) ප්‍රතිග්‍රහණය යනු අර්පනකරු විසින් අර්පනලාභියා වෙත කරනු ලබන කොන්දේසි විරහිත පිළිගැනීම වේ.

1.5 2007 අංක 07 දරණ සමාගම් පනත අනුව, කිසියම් පුද්ගලයෙකු සමාගමක අධ්‍යක්ෂවරයෙකු ලෙස පත්වීමට **නුසුදුසු** ලෙස සැලකීමට නම්, එම පුද්ගලයා:

**(a)** වයස අවුරුදු 18 ට අඩු විය යුතුය.

**(b)** සිහිවිකල් පුද්ගලයෙකු ලෙස තීන්දු කළ පුද්ගලයෙක් විය යුතුය.

**(c)** වෙනත් සමාගමක අධ්‍යක්ෂකවරයෙක් විය යුතුය.

**(d)** බංකොලොත් බවට විනිශ්චය කළ පුද්ගලයෙක් විය යුතුය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි ප්‍රකාශ වන්නේ:

(1) **(a), (b)** සහ **(c)** පමණි. (2) **(a), (b)** සහ **(d)** පමණි.

(3) **(b), (c)** සහ **(d)** පමණි. (4) **(a), (c)** සහ **(d)** පමණි.

1.6 පහත සඳහන් ඒවා අතුරෙන්, "නෞභාරපත" (Bill of Lading) සම්බන්ධයෙන් නිවැරදි **නොවන** ප්‍රකාශය කුමක් ද?

(1) එය නැව්ගත කළ භාණ්ඩ සඳහා කුවිතාන්සියක් (a receipt) ලෙස ක්‍රියා කරනු ලබයි.

(2) එය ජාත්‍යන්තර වෙළඳාමේ භාවිතවන ගෙවීම් ක්‍රමයකි.

(3) එය භාණ්ඩවල හිමිකම තහවුරු කිරීමට භාවිත කරනු ලබයි.

(4) එහි භාණ්ඩවල ප්‍රමාණය, තරම සහ බර ඇතුළත් වේ. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.7 පාර්ශවයන්ට ගිවිසුමට එළඹීමේ හැකියාවක් තිබීම, වලංගු ගිවිසුමක මූලිකාංගයකි.

1.8 සහායක ගිවිසුම් සාමාන්‍යයෙන් වලංගු ගිවිසුම් නොවන අතර, එමගින් බාල වයස්කරුවන් වගකීමට නොබැඳේ.

1.9 සේවකයෙකු විසින් සිය සේවා කාලය තුළදී ආයතනයට වංචා කරන ලද යම් මුදලක් වේ නම්, එම සේවකයාට අදාල පාරිතෝෂිකයෙන් එම මුදල අඩුකළ නොහැක. (එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.10 "භාණ්ඩ විකිණීමේ ආඥා පනතට" අනුව, විකුණුම්කරුට ඇති ප්‍රතිකර්ම දෙකක්(02) සඳහන් කරන්න.

1.11 භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ප්‍රධාන මූලිකාංග දෙකක්(02) සඳහන් කරන්න.

1.12 අර්පණයක් (offer) ප්‍රතික්ෂේප විය හැකි ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

1.13 ලියාපදිංචි කළ වෙළෙඳ ලකුණක (Trademark) හිමිකරුවෙකුට බුක්ති විඳිය හැකි අයිතිවාසිකම් දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

1.14 අන්තර්ජාතික වෙළෙඳ ආරවුලක් විසඳීම සඳහා යොදාගත හැකි ප්‍රධාන ආරවුල් විසඳීමේ ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න. (එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

කොවිඩ්-19 (COVID-19) වසංගතය පැතිරීමෙන් පසුව, කහ (ශ්‍රී ලංකාවේ මෙන්ම ආසියාවේ ද සම්ප්‍රදායික කුළුබඩු වර්ගයක් වන) තුළ වෛරස් විරෝධී ගුණ ඇති බවට බොහෝ දෙනා විශ්වාස කරනු ලැබිය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික කහ සඳහා ඇති ඉල්ලුම ස්වයංක්‍රියව වැඩිවීමට හේතු විය. කහ ගොවියෙකු වන **සංජය**, දේශීය වෙළෙන්දෙකු වන **බණ්ඩා** ට, “ශ්‍රී ලංකාවේ දේශීයව වගා කරන ලද කහ” ලෙස හඳුන්වමින් කහ බෑග් 500 ක් විකිණීමට එකඟ විය. **බණ්ඩා, සංජයගේ** ගබඩාව නිරීක්ෂණයට ගිය අවස්ථාවේදී **සංජය** විසින් අදාල කහ තොගයේ නියැදියක් **බණ්ඩා ට** පෙන්වනු ලැබිය. එකඟ වූ කහ බෑග් 500 බෙදාහැරීමෙන් පසු නියැදියට සමාන කහ ඇත්තේ බෑග් 200 ක පමණක් බවත් අනෙක් බෑග් 300 හි අඩංගු වන්නේ ශ්‍රී ලංකාවේ වවන ලද කහ නොවන බවත් ඒවා ඉන්දියාවෙන් ආනයනය කරනු ලැබූ කහ බවත් **බණ්ඩා ට** අනාවරණය විය.

මේ අතර, තවත් ගැනුම්කරුවෙකු වන **අමාරිස්** දුරකතනය හරහා **සංජය** සමඟ ගිවිසුම් ගත වී ඔහුගෙන් කහ බෑග් 1,000 ක් ඉල්ලා සිටි අතර, ඔවුන්ගේ දුරකතන සංවාදයේදී **සංජය** තමා විසින් විකුණනු ලබන කහ “ශ්‍රී ලංකාවේ වගා කරන ලද කහ” යනුවෙන් විස්තර කරන ලදී. **සංජය විසින් අමාරිස්** හට කිසිඳු කහ නියැදියක් නොපෙන්වන ලද අතර, ඇණවුම් කළ කහ ලැබුණු පසු ඒවා සියල්ල ඉන්දියාවේ නිෂ්පාදනය කරන ලද ඒවා බව **අමාරිස් ට** පැහැදිලි විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **සංජයට** එරෙහිව **බණ්ඩාගේ** නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න.** (ලකුණු 06)

(b) **සංජයට** එරෙහිව **අමාරිස්ගේ** නෛතික අයිතිවාසිකම් **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

පොළොන්නරුවේ වෙසෙන කිරි ගොවියෙකු වන **සිරිපාල**, කොළඹට ප්‍රවාහනය කිරීම පිණිස මී කිරි හට්ටි (curd pots) 10,000 ක් පොළොන්නරුව දුම්රිය ස්ථානයට බාරදෙන ලදී. කොළඹට ගමන්කරන අතරතුර අදාල මී කිරි ප්‍රවාහනය කරන ලද දුම්රිය, අවාසනාවන්ත ලෙස කැකිරාවට නුදුරු දුෂ්කර ප්‍රදේශයකදී පීලි පැනීමකට ලක්විය. දුම්රිය මාර්ගය අළුත්වැඩියා කිරීමට දින 4 සිට 6 දක්වා කාලයක් ගතවනු ඇති ඇති බව දුම්රිය රියැදුරා වටහාගත් අතර, ඔහු **සිරිපාල** සම්බන්ධ කර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරූ නමුත් ඒවා අසාර්ථක විය. ප්‍රවාහනය ප්‍රමාද වීම නිසා කිරි හට්ටි නරක්වීමට ආසන්න වූ බැවින් දුම්රිය රියැදුරු විසින් එම කිරි හට්ටි 10,000 ම ඒවායේ සත්‍ය වටිනාකමට වඩා අඩු මිලකට විකිණීමට කටයුතු කරන ලදී. පසුව දුම්රිය රියැදුරු විසින් කිරි හට්ටි 10,000 විකිණීමෙන් ලද මුදල් **සිරිපාල** වෙත යවන ලදී. කෙසේවෙතත්, **සිරිපාල** තමාට සිදුවී ඇති පාඩුව පියවා ගැනීම සඳහා දුම්රිය රියැදුරුට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සූදානමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

**සිරිපාලට** දැරීමට සිදුවූ අලාභය ගෙවීම සඳහා දුම්රිය රියැදුරු වගකිව යුතුද (liable) යන්න **විමසන්න.** (ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**A, B** සහ **C** හවුල් ව්‍යාපාරයක නිරතව සිටින අතර, විවාහ උත්සව සහ උපන්දින සාද සැලසුම් කිරීම සහ සැරසිලි කිරීම සම්බන්ධ කටයුතුවල නියැලේ. උත්සව සහ සාද සඳහා කුලියට දීමේ අරමුණින් පිළිගැනීමේ ශාලාවක් (reception hall) මිලදී ගැනීම සඳහා **සීමාසහිත PQ මූල්‍ය සමාගමෙන්** ණය මුදලක් ලබාගැනීමට **A** විසින් යෝජනා කරන ලදි. **Aගේ** යෝජනාවට **B** තම කැමැත්ත ප්‍රකාශ කළ අතර, **C** ඊට එකඟ නොවීය. සාකච්ඡා කළ පරිදි **A** සහ **B** විසින් ණය මුදල ලබාගෙන අදාල පිළිගැනීමේ ශාලාව මිලදී ගනු ලැබිය. ඉන් මාස කිපයකට පසු ඇතිවූ කොවිඩ්-19 (COVID-19) වසංගතය හේතුකොටගෙන, උත්සව සහ ඒවාට සම්බන්ධ සැරසිලි සඳහා වන ඉල්ලුම අඩුවූ අතර, හවුල් ව්‍යාපාරය බුන්වත්භාවයට (bankrupt) පත්විය. **සීමාසහිත PQ මූල්‍ය සමාගම** විසින් හවුල්කරුවන් තිදෙනාම විත්තිකරුවන් ලෙස නම් කරමින් ණය ආපසු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන ඇත.

**Cගේ** අදහස වනුයේ ඔහු අදාල ණය ගිවිසුමට අත්සන් නොකළ බැවින්, **A** සහ **B** විසින් ලබාගත් ණය මුදල ගෙවීම සම්බන්ධයෙන් ඔහු හට වගකීමක් නොමැති බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **Cගේ** මතයේ වලංගුභාවය (validity) පිළිබඳව **විමසන්න**. (ලකුණු 07)

(b) අධිකරණය මගින් හවුල් ව්‍යාපාරයක් විසුරුවා (dissolve) හැරිය හැකි අවස්ථා (instances) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **05** වන ප්‍රශ්නය

පහත දැක්වන විනිමය බිල්පත (Bill of Exchange) සළකා බලන්න:

2020.06.03

**වෙත: සීතා රණවක පෙරේරා,**

**අංක 75, නාවල පාර, රාජගිරිය.**

**ලද වටිනාකම සළකා බලා රජිව් සිල්වාට රුපියල් අසූ දහසක් (රු.80,000/-) ගෙවනු.**



රන්ජන් සිවගනේෂ්

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සඳහන් විනිමය බිල්පතට අදාල ප්‍රධාන පාර්ශවයන් (main parties) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(b) වලංගු විනිමය බිල්පතක ලක්ෂණ (features) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) විනිමය බිල්පතක් සහ චෙක්පතක් අතර ඇති වෙනස්කම් තුනක්(03) **හඳුනා දක්වන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## **06** වන ප්‍රශ්නය

කොවිඩ්-19 (COVID-19) ගෝලීය වසංගතය අතරතුර, රටේ සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ජීවිතය තුළ විද්‍යුත් ගනුදෙනු කෙරෙහි ඇති අදාලත්වය කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, ඊට සමගාමීව වාර්තා වූ සයිබර් සම්බන්ධ වැරදි ද (offences) විශාල ලෙස ඉහළ ගොස් තිබේ. ශ්‍රී ලංකාවේ දැනට පවතින නෛතික රාමුව තුළ මෙම තත්ත්වය විසඳීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් උපරිම උත්සාහයන් ගනිමින් සිටී. 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත මෙම ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ඇති ප්‍රධානතම නෛතික පනත වේ.

තවද, ගෝලීය වසංගත තත්ත්වය හේතුකොටගෙන ශ්‍රී ලංකාව ඇතැම් නිෂ්පාදිතයන් ආනයනය කිරීම සීමාකළ අතර, මේ හේතුවෙන් සමහර වෙළෙඳුන් භාණ්ඩ විකිණීමේදී විවිධ අක්‍රමිකතා (malpractices) සිදුකරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ අරමුණු (objectives) තුනක්(03) **සඳහන් කරන්න**.
(ලකුණු 03)

(b) 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ විෂය පථයෙන් ඉවත් කරන ලද ලේඛන (articles) / නෛතික සාධන පත්‍ර (instruments) දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(c) 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනතේ ප්‍රධාන කාර්යභාරයන් (functions / duties) තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)
(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

(මුළු ලකුණු 25)

## **07** වන ප්‍රශ්නය

(A) **දිනු** සහ **රාම්** ඔවුන්ගේ විවාහ මංගල උත්සවය 2020 ඔක්තෝම්බර් 15 දින පැවැත්වීමට සැලසුම් කළ අතර, ඔවුන් 2020 ජනවාරි මාසයේදී හෝටල් බිලෙන් අඩක් ගෙවා වෙරළබඩ හෝටලයක් (beach hotel) වෙන්කර ගත්හ. දෙපාර්ශවය අතර ගිවිසුමේ නියමයන් සහ කොන්දේසි පිළිබඳව ලිඛිත කිසිවක් නොතිබුණු නමුත්, **දිනු** විසින් මූලික ගෙවීමට අදාල රිසිට් පත ඇයගේ ලිපි ගොනුවක සුරක්ෂිතව තබාගන්නා ලදී. කෙසේවෙතත්, රට තුළ පැතිරී ගිය කොවිඩ්-19 (COVID-19) වසංගතයේ දෙවෙනි රැල්ල (second wave) හේතුවෙන් රජය විසින් 2020 ඔක්තෝම්බර් 13 දින සිට කිසිදු පෞද්ගලික උත්සවයක් පැවැත්වීම යළි දැනුම්දෙන තුරු තහනම් කරන ලදී. **දිනු** සහ **රාම්** මංගල උත්සවය අවලංගු කිරීමට තීරණය කළ අතර, එම දිනයේම විවාහය ලියාපදිංචි කරන ලදී. එදිනම, **දිනු** විසින් මෙම අවලංගු කිරීම සම්බන්ධයෙන් හෝටලයේ කළමනාකරුට දැනුම් දුන් විට, ඔහු විසින් එම යුවළ ගෙවන ලද මුදල ආපසු ගෙවීම ප්‍රතික්ෂේප කරන ලදී. **දිනුගේ** සහෝදරයා වන **සෑම්** විසින් විවාහක යුවළට මෝටර් රථයක් තෑගි කරන ලදී.

**රාම්** තොරතුරු තාක්ෂණ ඉංජිනේරුවරයෙකු වූ අතර, ඔහුට ඔහුගේ නව මෝටර් රථය සඳහා **ජනහිත රක්ෂණ සමාගමෙන්** රක්ෂණාවරණයක් ලබාගැනීමට අවශ්‍ය විය. අයදුම්පත්‍රය පුරවන අවස්ථාවේදී "මෝටර් රථයක් පැදවීමට අදාලව ඔබ හෝ මෙම වාහනය පැදවීමට නියමිත පුද්ගලයින් කිසිදු දිනක කිසියම් වරදක් සම්බන්ධව වැරදිකරුවෙකු වී තිබේද?" යන්න විමසන ලදී. කෙසේවෙතත්, ඉහත ප්‍රශ්නයට **රාම්** "නැත", යනුවෙන් පිළිතුරු ලබා දුන්න ද, ඔහු විසින් සිදුකරන ලද තාක්ෂණික වරදකට (technical offence) වසර 5 ක දණ්ඩනයකට ලක් වී තිබුණි. **ජනහිත රක්ෂණ සමාගම** ඔහුගේ අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරන ලදී.

මේ අතරතුර, ඔහු විසින් **සහන රක්ෂණ සමාගමෙන්** ඔහුගේ මෝටර් රථය සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගන්නා ලද අතර, රක්ෂණ ආවරණය ලබා ගැනීමෙන් මාස කීපයකට පසුව මහජන විරෝධතාවයක් (protest) හේතුවෙන් ඔහුගේ මෝටර් රථය හානියට පත්විය.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **දිනූ** සහ **රාම්** ට ඔවුන් විසින් සිදුකළ මූලික ගෙවීම සම්බන්ධයෙන් ගතහැකි ප්‍රතිකර්ම (remedies) **විමසන්න**. (ලකුණු 07)

(b) **රාම්** විසින් ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රය **ජනහිත රක්ෂණ සමාගමට** ප්‍රතික්ෂේප කළ හැකි ද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(c) මෝටර් රථයට සිදුවූ හානිය සම්බන්ධයෙන් **රාම්** ට ඇති නෛතික අයිතිවාසිකම් (legal rights) **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(B) **හමීඩ්,** 2020 නොවැම්බර් 15 දින සිට මධ්‍යම ප්‍රමාණයේ සුපිරි වෙළෙඳසැලක් වන **ෆුඩ්මාට් හි**, මුදල් අයකැමිවරයෙකු ලෙස සේවයේ යෙදී සිටී. **ෆුඩ්මාට්** ආයතනයේ මුදල් අයකැමියන් දෙදෙනෙක් (2), විකුණුම් නියෝජිතයන් පස් (5) දෙනෙක්, ආරක්ෂක නිළධාරියෙකු (1), පිරිසිදු කරන්නෙකු (1) සහ කළමනාකරුවෙකු (1) වශයෙන් මුළු කාර්ය මණ්ඩලය 10 දෙනෙකි. 2021 මාර්තු 01 දින **හමීඩ්ගේ** අතැති මුදල් ශේෂය ගිණුම්කරණ පද්ධතියේ පෙන්නුම් කරන ශේෂයට වඩා අඩු බව **ෆුඩ්මාට් හි** කළමනාකරුගේ අවධානයට යොමුවිය. එසැනින්ම කළමනාකරු විසින් **හමීඩ්** ට දොස් පවරා කිසිදු අභ්‍යන්තර විනය පරීක්ෂණයකින් තොරව ඔහුව සේවයෙන් පහකොට (terminated) එම ස්ථානයෙන් වහාම පිටව යන ලෙස දැනුම් දෙන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

1954 අංක 19 දරණ සේවකයන්ගේ සේවය අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ නියමයන්ට අනුව **හමීඩ්** සතු නෛතික අයිතිවාසිකම් (legal rights) පිළිබඳව **විමසන්න**. (ලකුණු 08)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැළපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |